# සතිපතා ආර්ථික දර්ශක

## 2021 සැප්තැම්බර් 17



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

2021 වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 12.3කින් වර්ධනය විය. මෙහිදී, කර්මාන්ත,සේවා සහ කෘෂිකාර්මික කටයුතු පිළිවෙළින් සියයට 22.1කින්, සියයට 7.5කින් සහ සියයට 8.1කින් වර්ධනය වන ලදී. තවද, භාණ්ඩ හා සේවා මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු සියයට 30.3කින් වර්ධනය විය.

2021 ජූලි මාසයට සාපේක්ෂව 2021 අගෝස්තු මාසයේ දී, නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පිළිවෙළින්, 45.1ක හා 46.2ක අගයන් වාර්තා කරමින් පහළ යන ලදී.

2021 ජූලි මාසයේ කාර්මික නිෂ්පාදන දර්ශකය, 2020 ජූලි මාසයට සාපේක්ෂව 109.7 දක්වා සියයට 1.4කින් පහළ යන ලදී. නිෂ්පාදන කර්මාන්තයන්හි ප්‍රධාන උප කාණ්ඩයන් සැලකීමේ දී, "රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන" (සියයට 30.2) සහ "ඇඟලුම් නිෂ්පාදන" (සියයට 6.5) යන කාණ්ඩයන්හි නිෂ්පාදන පහළ යෑම සමස්ත දර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

සලකා බලන කාලපරිච්ඡේදය (2021.09.11 සිට 2021.09.17 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් 2021 ජූලි මස මැද භාගයේ සිට වාර්තා කළ වැඩිම අගය වාර්තා කරමින් ඉහළ ගියේය. අයිඩා සුළි කුණාටුවෙන් පසුව පසුගිය සතියේ සිට එක්සත් ජනපද ගල්ෆ් කලාපයේ පිරිපහදු කිරීම් සහ අක්වෙරළ තෙල් කැණීම් කටයුතු අඩාල වීම සහ මේ මස ඇතුළත එක්සත් ජනපද බොරතෙල් නිෂ්පාදනයට බලපෑම් ඇති කළ දෙවැනි කුණාටුව වන නිකොලස් සුළි කුණාටුව නිසා එක්සත් ජනපදයේ තෙල් සැපයුම්වලට බාධා ඇති වීම හේතුවෙන් මිල ගණන් ඉහළ ගියේය. එක්සත් ජනපද බොරතෙල් සංචිත අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටීම සහ පුළුල්ව ක්‍රියාත්මක වන එන්නත්කරණ වැඩසටහන් සමඟ බොරතෙල් සඳහා වන ඉල්ලුම යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කිරීම ද මිල ගණන් ඉහළ යෑමට සහාය විය. සමස්තයක් ලෙස, මෙම කාල සීමාව තුළ දී බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. දෙවර්ගයේම බොරතෙල් බැරලයක මිල ගණන් එ.ජ. ඩොලර් 2.00කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2021 සැප්තැම්බර් මස 17 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 12 කින් සියයට 6.40ක් දක්වා ඉහළ ගියේය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 162.778 හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 206.595 හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2021 සැප්තැම්බර් මස 17 දින වනවිට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.71කින් දර්ශක අගය 8,801.95 දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 1.31කින් දර්ශක අගය 3,291.87 දක්වා පහළ ගියේය.

## විදේශීය අංශය

2021 වසරේ සැප්තැම්බර් 17 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ. ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.8කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 7.8කින්, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 6.4කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 2.5කින් සහ ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 0.7කින් අවප්‍රමාණය විය.

2021 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,802.6ක් දක්වා සියයට 23.7කින් ඉහළ ගිය අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (21.9%), රබර් නිෂ්පාදිත (41.9%) සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (61.4%) අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. 2021 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 11,724.8ක් දක්වා සියයට 30.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන්ධන (41.5%), යන්ත්‍රසූත්‍ර හා උපකරණ (39.4%) සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග (34.8%) ආනයන ඉහළ යෑම මේ සඳහා විශාල වශයෙන් හේතු විය. ඒ අනුව, 2021 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී වෙළඳ හිඟය 2020 වසරේ පළමු මාස හත තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,470.5 සිට එ.ජ. ඩොලර් මිලියන 4,922.3ක් දක්වා පුළුල් විය.

සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ ජූලි මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 6.1කින් ඉහළ ගියේය. 2021 වසරේ ජූලි මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 20.1කින් ඉහළ ගිය අතර, මේ සඳහා පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් ඉහළ යෑම හේතු විය. මේ අනුව, 2021 වසරේ ජූලි මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 93.9ක් දක්වා සියයට 11.6කින් පහළ ගියේය.

තේ සඳහා සාමාන්‍ය මිල (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2020 වසරේ ජූලි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.30 සිට 2021 වසරේ ජූලි මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 2.96ක් දක්වා පහත වැටුණි. 2021 වසරේ ජූලි මාසයේ දී බොරතෙල් සඳහා වූ ආනයන මිල ගණන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 49.1කින් ඉහළ ගියේය.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | ජූලි 2021 | මසකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 146.6 | 145.7 | 137.3 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.6 | 1.5 | 0.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 5.4 | 5.4 | 5.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 6.8 | 6.1 | 6.1 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 145.6 | 144.6 | 139.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.4 | 4.4 | 4.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.4 | 4.1 | 4.5 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100)** | **අගෝස්තු 2021** | **මසකට පෙර** | **වසරකට පෙර** |
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 143.5 | 143.1 | 135.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.3 | 0.5 | 0.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.3 | 4.2 | 4.8 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 6.0 | 5.7 | 4.1 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 144.6 | 144.1 | 138.9 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 3.2 | 3.1 | 3.8 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.1 | 3.7 | 3.2 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 102.60 | 102.63 | 119.87 | 96.00 | ලැනො. | ලැනො. | 135.00 | 98.00 |
| රතු කැකුළු | 93.80 | 93.20 | 92.90 | 88.00 | ලැනො. | ලැනො. | 98.00 | 93.00 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 120.00 | 130.00 | 226.00 | 212.00 | 146.00 | 153.33 | 264.00 | 251.33 |
| ගෝවා | 99.00 | 106.67 | 104.00 | 80.67 | 129.00 | 136.67 | 138.00 | 128.67 |
| කැරට් | 87.00 | 96.67 | 100.00 | 110.93 | 114.00 | 126.67 | 138.00 | 149.00 |
| තක්කාලි | 93.00 | 111.67 | 101.00 | 113.27 | 118.00 | 136.67 | 132.00 | 151.00 |
| වට්ටක්කා | 59.00 | 85.00 | 104.00 | 127.33 | 80.00 | 110.00 | 128.00 | 159.00 |
| පතෝල | 118.00 | 120.00 | 134.00 | 140.00 | 138.00 | 140.00 | 162.00 | 172.00 |
| වම්බටු | 128.00 | 120.00 | 141.00 | 45.93 | 168.00 | 160.00 | 168.00 | 82.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 241.31 | 234.79 | 196.17 | 162.60 | 288.00 | 280.00 | 212.50 | 199.67 |
| ලොකු ළූණු (ආනයනික) | 103.00 | 114.34 | 97.17 | 156.07 | 142.00 | 131.67 | 111.33 | 188.33 |
| අර්තාපල් (දේශීය) | 152.08 | 159.86 | 215.95 | 127.63 | 166.00 | 186.67 | 230.00 | 157.33 |
| වියළි මිරිස් (ආනයනික) | 500.67 | 514.67 | 502.00 | 410.00 | 530.00 | 526.67 | 530.00 | 450.00 |
| පරිප්පු | 233.67 | 242.17 | 211.33 | 138.00 | ලැනො. | 230.00 | 221.67 | 150.00 |
| බිත්තර-සුදු (ඒකක මිල) | 14.50 | 15.70 | 18.15 | 16.50 | 15.30 | 16.67 | 18.60 | 17.50 |
| පොල් (ගෙඩියක මිල) | 72.20 | 73.00 | 70.60 | ලැනො. | 85.00 | 85.00 | 90.00 | 65.50 |
| අමු මිරිස් | 120.00 | 110.00 | 126.00 | 147.00 | 154.00 | 140.00 | 162.00 | 216.00 |
| දෙහි | 139.00 | 121.67 | 78.00 | 45.00 | 170.00 | 158.33 | 114.00 | 72.00 |
| **මාළු (අ)** | | | | | | | | |
| කෙලවල්ලා | 750.00 | 700.00 | 646.00 | 612.50 | ලැනො. | ලැනො. | ලැනො. | 912.50 |
| බලයා | 374.00 | 374.00 | 382.00 | 432.50 | ලැනො. | ලැනො. | ලැනො. | 532.50 |
| සාලයා | 144.00 | 147.50 | 192.00 | 180.00 | ලැනො. | ලැනො. | ලැනො. | ලැනො. |
| හුරුල්ලා | 433.33 | 470.00 | 426.00 | 405.00 | ලැනො. | ලැනො. | ලැනො. | 505.00 |

(අ) 2020 ඔක්තෝබර් 21 වන දින සිට පෑලියගොඩ ධීවර වෙළඳපොළෙහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි .

ලැනො. - ලැබී නොමැත.

# නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල (අ)



















(අ) 2021 අගෝස්තු 23 වන දින සිට නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේහි සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි.

## 1.2.2 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය (අ)

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 105.90 | 115.00 |
| රතු කැකුළු | 91.50 | 95.83 |
| **එළවළු** | | |
| බෝංචි | 134.00 | 142.50 |
| ගෝවා | 87.50 | 95.00 |
| කැරට් | 87.50 | 77.50 |
| තක්කාලි | 86.00 | 91.67 |
| වට්ටක්කා | 50.00 | 62.50 |
| පතෝල | 66.88 | 75.00 |
| වම්බටු | 142.50 | 124.17 |
| අළු කෙසෙල් | 38.00 | 45.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 208.00 | 206.67 |
| ලොකු ළූණු (ආනයනික) | 96.50 | 101.67 |
| අර්තාපල් (දේශීය) | 124.50 | 130.83 |
| වියළි මිරිස් (ආනයනික) | 522.50 | 531.25 |
| පොල් (ගෙඩියක මිල) | 57.70 | 56.33 |

## 1.2.3 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය (අ)

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 103.00 | 103.00 |
| රතු කැකුළු | 95.00 | 95.00 |
| **එළවළු** | | |
| බෝංචි | 176.00 | 160.00 |
| ගෝවා | 166.00 | 160.00 |
| කැරට් | 120.00 | 106.67 |
| තක්කාලි | 126.00 | 145.00 |
| වට්ටක්කා | 117.00 | 106.67 |
| පතෝල | 166.00 | 150.00 |
| වම්බටු | 232.00 | 173.33 |
| අළු කෙසෙල් | ලැනො. | ලැනො. |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 380.00 | 300.00 |
| ලොකු ළූණු (ආනයනික) | 137.60 | 131.67 |
| අර්තාපල් (දේශීය) | 204.00 | 220.00 |
| අර්තාපල් (ආනයනික) | 130.00 | 128.33 |
| වියළි මිරිස් (ආනයනික) | 554.00 | 560.00 |
| පරිප්පු | 251.00 | 252.67 |
| සුදු සීනි | 120.00 | 120.67 |
| බිත්තර-සුදු (එකක මිල) | 16.20 | 17.67 |
| පොල් (ගෙඩියක මිල) | 72.00 | 71.67 |
| අමු මිරිස් | 242.00 | 170.00 |
| **මාළු** | | |
| කෙලවල්ලා | 1,366.00 | 1,446.67 |
| බලයා | 400.00 | 383.33 |
| සාලයා | 206.00 | 206.67 |
| හුරුල්ලා | 607.50 | 620.00 |

## 1.2.4 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | |
|---|---|---|---|---|
| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 101.00 | 100.90 | 112.75 | 99.10 |
| සුදු කැකුළු | 93.20 | 93.90 | 94.75 | 87.30 |
| රතු කැකුළු | 92.00 | 93.00 | 93.75 | 90.10 |
| නාඩු | 96.00 | 96.40 | 103.50 | 90.30 |

(අ) මෙම සතිය සහ පසුගිය සතිය තුළ දී දඹුල්ල සහ නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානවල සිල්ලර වෙළඳ කටයුතු සිදු නොවුණි .
ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | 2019<br>වාර්ෂික (අ)(ආ) | 2020<br>වාර්ෂික (අ) | 2020<br>පළමුවන කාර්තුව (අ)(ආ) | 2021<br>දෙවන කාර්තුව (අ) |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 1.0 | (2.4) | 6.1 | 8.1 |
| කාර්මික | 2.6 | (6.9) | 5.5 | 22.1 |
| සේවා | 2.2 | (1.5) | 3.0 | 7.5 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 2.4 | (8.0) | 11.2 | 30.3 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **2.3** | **(3.6)** | **4.3** | **12.3** |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2020<br>ජන.- ජූලි (අ) | 2021<br>ජන.- ජූලි (ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ. මිලියන) | 156.9 | 185.9 | 18.5 |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 44.0 | 50.2 | 14.1 |
| පොල් | (ගෙඩි මිලියන) | 1,603.7 | 1,762.7 | 9.9 |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | ජූලි<br>2020 (ආ) | <br>2021 (ඇ) | % වෙනස |
|---|---|---|---|
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **111.3** | **109.7** | **(1.4)** |
| ආහාර නිෂ්පාදන | 117.8 | 116.2 | (1.3) |
| ඇඟලුම් නිෂ්පාදන | 93.8 | 87.7 | (6.5) |
| අනෙකුත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 131.9 | 148.9 | 12.9 |
| පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන | 97.7 | 98.7 | 1.0 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 98.5 | 107.1 | 8.7 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 120.1 | 83.8 | (30.2) |
| පාන වර්ග | 123.9 | 119.3 | (3.7) |

(අ) ප්‍රධාන උප අංශ 7

(ආ) සංශෝධිත (ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන<br>ජූලි 2020 | <br>අගෝ. 2020 | <br>ජූලි 2021 | <br>අගෝ. 2021 | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා<br>ජූලි 2020 | <br>අගෝ. 2020 | <br>ජූලි 2021 | <br>අගෝ. 2021 |
|---|---|---|---|---|---|---|---|---|
| දර්ශකය | 64.6 | 57.9 | 57.8 | 45.1 | 51.4 | 56.0 | 55.7 | 46.2 |







## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2020<br>ජූලි | 2021<br>ජූලි | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - නාමික | 114.6 | 114.6 | - |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) - නාමික | 186.3 | 199.6 | 7.1 |
| කෘෂිකර්මාන්ත | 195.5 | 203.5 | 4.1 |
| කර්මාන්ත | 185.5 | 203.0 | 9.5 |
| සේවා | 183.1 | 194.6 | 6.3 |



## 1.7.2 සේවා නියුක්තිය [(අ)]

| අයිතමය | 2020 පළවන කාර්තුව | 2021 පළවන කාර්තුව [(ආ)] | 2020 වාර්ෂික |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 51.0 | 50.9 | 50.6 |
| සේවා වියුක්ති අනුපාතිකය | 5.7 | 5.7 | 5.5 |

| අයිතමය | 2019 සිව්වන කාර්තුව | 2020 සිව්වන කාර්තුව | 2020 වාර්ෂික |
|---|---|---|---|
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් [(ඇ)] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 27.1 | 29.0 | 27.1 |
| කර්මාන්ත | 26.9 | 26.2 | 26.9 |
| සේවා | 46.1 | 44.8 | 46.0 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව







## 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2020 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)[(අ)] | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)[(අ)] |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 64.28 | 58.28 | 70.44 | 54.85 | 51.65 | 57.65 |
| පෙබරවාරි | 55.86 | 51.04 | 63.68 | 61.82 | 58.63 | 64.07 |
| මාර්තු | 34.63 | 31.42 | 37.67 | 65.89 | 62.60 | - |
| අප්‍රේල් | 26.46 | 19.03 | 19.56 | 65.22 | 61.61 | 66.44 |
| මැයි | 32.28 | 28.41 | 25.44 | 68.24 | 65.13 | 68.47 |
| ජූනි | 40.43 | 37.89 | 38.35 | 73.11 | 71.01 | - |
| ජූලි | 43.07 | 40.64 | 46.23 | 74.41 | 72.79 | 68.92 |
| අගෝස්තු | 45.07 | 42.40 | 47.74 | 70.45 | 67.76 | |
| සැප්තැම්බර් | 42.02 | 39.67 | 44.05 | | | |
| ඔක්තෝබර් | 41.55 | 39.55 | 41.77 | | | |
| නොවැම්බර් | 43.48 | 40.99 | 45.88 | | | |
| දෙසැම්බර් | 49.91 | 46.82 | 51.89 | | | |
| **දිනය** | **2020** | | | **2021** | | |
| සැප්තැම්බර් 11 | 39.91 | 37.30 | | - | - | |
| සැප්තැම්බර් 12 | - | - | | - | - | |
| සැප්තැම්බර් 13 | - | - | | 73.50 | 70.30 | |
| සැප්තැම්බර් 14 | 39.75 | 37.38 | | 73.65 | 70.66 | |
| සැප්තැම්බර් 15 | 39.64 | 37.31 | | 73.95 | 70.80 | |
| සැප්තැම්බර් 16 | 40.87 | 38.64 | | 75.58 | 72.69 | |
| සැප්තැම්බර් 17 | 42.31 | 40.16 | | 75.75 | 72.67 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං .ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ ඍජුව සැසඳිය නොහැකිය . එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ.

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| අයිතමය | 2021 සැප්තැම්බර් 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 5.00 | 5.00 | 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 6.00 | 6.00 | 5.50 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 5.96 | 5.95 | 4.52 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික** | | | |
| දින 91 | 6.08 | 6.01 | 4.51 |
| දින 182 | - | - | 4.64 |
| දින 364 | 6.12 | 6.05 | 4.88 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 6.40 | 6.28 | 6.25 |
| | 2021 ජූලි | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.10-6.00 | 0.10-7.00 | 0.20-7.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 0.25-15.00 | 0.25-15.00 | 1.60-15.00 |
| | 2021 අගෝ | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 4.75 | 4.77 | 6.74 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 5.62 | 5.67 | 8.26 |
| | 2021 ජූලි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 4.99 | 4.98 | 5.78 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 5.15 | 5.10 | 5.96 |
| | 2021 ජූලි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 9.45 | 9.50 | 12.29 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 8.09 | 7.47 | 9.85 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2021 ජූලි | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.50 | 3.50 | 4.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 5.00 | 5.00 | 5.75 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02 මාස 09<br>2021 සැප්තැම්බර් 13 | වසර 04 මාස 06<br>2021 සැප්තැම්බර් 13 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 10.25 | 11.25 |
| බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය | 8.10 | 10.05 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2021 සැප්තැම්බර් 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2021 සැප්තැම්බර් 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 6.31 | 6.14 | කාර්ගිල්ස් බැංකුව | 6.51 | 6.62 |
| මහජන බැංකුව | 6.32 | 5.95 | එච්එස්බීසී බැංකුව | 7.25 | 7.19 |
| හැටන් නැෂනල් බැංකුව | 6.19 | 6.01 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 6.84 | 6.40 |
| කොමර්ෂල් බැංකුව | 6.01 | 6.06 | සිටි බැංකුව | 6.85 | 6.59 |
| සම්පත් බැංකුව | 6.52 | 5.97 | ඩොයිෂ් බැංකුව | 7.04 | 7.07 |
| සෙලාන් බැංකුව | 5.89 | 6.16 | හබීබ් බැංකුව (අ) | 5.20 | 5.20 |
| යූනියන් බැංකුව | 6.49 | 6.88 | ඉන්දියන් බැංකුව (අ) | 8.00 | 8.00 |
| පෑන් ඒෂියා බැංකුව | 7.44 | 7.09 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 6.82 | 6.82 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 6.34 | 5.78 | එම්සීබී බැංකුව | 6.60 | 5.85 |
| ඩීඑෆ්සීසී බැංකුව | 6.67 | 6.17 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 8.00 | 7.00 |
| එන්ඩීබී බැංකුව | 6.50 | 6.50 | පබ්ලික් බැංකුව | 6.67 | 5.63 |
| අමානා බැංකුව (අ) | 5.96 | 5.96 | | | |

(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත . එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සදහන් කර ඇත .

## 2.2 මුදල් සැපයුම

| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2021 ජූලි (අ) | මසකට පෙර | වසරකට පෙර (ආ) | 2021 ජූලි (අ) | මසකට පෙර | වසරකට පෙර (ආ) |
| සංචිත මුදල් | 1,063.9 | 1,065.1 | 878.8 | 21.1 | 22.6 | (1.1) |
| පටු මුදල් සැපයුම ($M_1$) | 1,317.0 | 1,293.3 | 1,024.6 | 28.5 | 29.1 | 28.3 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 9,269.6 | 9,136.2 | 7,717.8 | 20.1 | 20.1 | 15.2 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 10,303.6 | 10,164.8 | 8,507.4 | 21.1 | 21.5 | 15.7 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ඇ) | (699.4) | (481.3) | (48.9) | (1,330.2) | (4,012.3) | (142.9) |
| මුදල් අධිකාරීන් | 10.3 | 306.6 | 785.2 | (98.7) | (62.8) | (4.7) |
| වාණිජ බැංකු | (709.6) | (787.9) | (834.1) | 14.9 | 5.8 | (17.5) |
| දේශීය බැංකු ඒකක (DBUs) | (433.4) | (476.0) | (406.3) | (6.7) | (26.4) | (18.5) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | (276.3) | (311.9) | (427.8) | 35.4 | 32.2 | (16.6) |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ඇ) | 11,003.0 | 10,646.1 | 8,556.3 | 28.6 | 27.1 | 18.2 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 5,513.4 | 5,194.6 | 3,783.6 | 45.7 | 44.3 | 39.9 |
| මහ බැංකුව | 1,418.0 | 1,178.9 | 550.0 | 157.8 | 111.8 | 59.0 |
| වාණිජ බැංකු | 4,095.4 | 4,015.7 | 3,233.6 | 26.7 | 32.0 | 37.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,667.8 | 3,574.0 | 2,755.6 | 33.1 | 39.4 | 40.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 427.6 | 441.7 | 478.0 | (10.5) | (7.8) | 21.5 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,140.9 | 1,132.1 | 982.6 | 16.1 | 19.0 | 34.7 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 653.7 | 656.0 | 557.0 | 17.4 | 22.8 | 20.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 487.2 | 476.1 | 425.6 | 14.5 | 14.1 | 59.3 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 6,661.5 | 6,584.9 | 5,828.0 | 14.3 | 12.9 | 4.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,163.1 | 6,100.3 | 5,383.8 | 14.5 | 13.3 | 3.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 498.3 | 484.6 | 444.1 | 12.2 | 8.7 | 7.6 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (2,312.8) | (2,265.5) | (2,037.8) | (13.5) | (12.9) | (14.1) |

(අ) තාවකාලික (ආ) සංශෝධිත (ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අදාළව










## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2021 සැප්තැම්බර් 16 | 2021 සැප්තැම්බර් 09 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,291,257.48 | 1,278,383.89 | 12,873.59 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2021 සැප්තැම්බර් 13 | 2021 සැප්තැම්බර් 14 | 2021 සැප්තැම්බර් 15 | 2021 සැප්තැම්බර් 16 | 2021 සැප්තැම්බර් 17 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 5.97 | 5.96 | 5.96 | 5.96 | 5.96 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 30,700 | 33,800 | 36,400 | 32,500 | 39,300 |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 5.90 | 5.92 | 5.92 | 5.92 | 5.92 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 14,271 | 8,773 | 10,279 | 10,026 | 9,729 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2021 සැප්තැම්බර් 13 | 2021 සැප්තැම්බර් 14 | 2021 සැප්තැම්බර් 15 | 2021 සැප්තැම්බර් 16 | 2021 සැප්තැම්බර් 17 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 1,290,361.41 | 1,284,370.13 | 1,284,370.13 | 1,284,370.13 | 1,330,316.46 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 1,252,755.12 | 1,246,864.42 | 1,246,435.13 | 1,246,710.51 | 1,290,390.04 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2021 සැප්තැම්බර් 13 | 2021 සැප්තැම්බර් 14 | 2021 සැප්තැම්බර් 15 | 2021 සැප්තැම්බර් 16 | 2021 සැප්තැම්බර් 17 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 94.340 | 96.180 | 80.385 | 83.409 | 70.235 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 252.550 | 271.634 | 265.432 | 293.240 | 276.830 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | (158.210) | (175.454) | (185.047) | (209.831) | (206.595) |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | (158.210) | (175.454) | (185.047) | (209.831) | (206.595) |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | 2020 දෙසැ. අවසානයට | 2021 ජූනි අවසානයට | 2021 ජූලි අවසානයට (ආ) |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 1,879,255 | 1,937,280 | 1,941,431 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 17,291 | 16,556 | 16,454 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,861,964 | 1,920,724 | 1,924,977 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 117,260 | 118,636 | 121,663 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 32,760 | 33,563 | 34,825 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 84,500 | 85,074 | 86,838 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික

## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු. බිලියන) | 2020 දෙසැ. අවසානයට | 2021 ජූනි අවසානයට | 2021 ජූලි අවසානයට (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) (ඇ) | 4.5 | 2.9 | 3.3 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.5 | 2.1 | 1.6 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික (ඇ) වසරේ මේ දක්වා එකතුව







## 2.9 කොටස් වෙළඳපොළ

| අයිතමය | 2021 සැප්තැම්බර් 17 වැනි දිනට | 2021 සැප්තැම්බර් 10 වැනි දිනට | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 8,801.95 | 8,865.30 | 5,720.67 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 3,291.87 | 3,335.51 | 2,512.40 |
| දෛනික පිරිවැටුම (සතිපතා සාමාන්‍යය) (රු. මිලියන) | 4,721.53 | 7,909.43 | 3,195.89 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 3,922.23 | 3,950.47 | 2,486.27 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 91.16 | 80.99 | 295.53 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 596.01 | 132.33 | 757.14 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (504.85) | (51.34) | (461.61) |

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2020 ජන.-ජූනි[(අ)] | 2021 ජන.-ජූනි [(ආ)] |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **665.5** | **715.3** |
| ආදායම | 663.4 | 714.5 |
| බදු ආදායම | 580.8 | 641.2 |
| බදු නොවන | 82.5 | 73.3 |
| ප්‍රදාන | 2.1 | 0.7 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **1,401.2** | **1,495.5** |
| පුනරාවර්තන | 1,237.4 | 1,311.0 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 163.7 | 184.5 |

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධන ඇතුලත් නොවේ.
(ආ) තාවකාලික




## 3.2 මධ්‍යම රජයේ නොපිය වූ ණය (රු. බිලියන) [(අ)]

| ශීර්ෂය | 2020 වසර අවසානයට | 2021 ජූනි අවසානයට [(ආ)] |
|---|---|---|
| සමස්ත දේශීය ණය | 9,065.1 | 9,931.7 |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,620.7 | 1,795.2 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 5,713.3 | 6,092.3 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 6,052.2 | 6,632.8 |
| **මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය** | **15,117.2** | **16,564.5** |

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.
(ආ) තාවකාලික




මූලයන් : මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2021 සැප්තැම්බර් 15 දිනෙන් අවසන් වූ සතියට

| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ [(අ)] % | | ද්විතීයික වෙළඳපොළ [(ආ)] % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | පසුගිය සතියේ සාමාන්‍යය |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | |
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 6.08 | 6.01 | 6.00 | 5.83 | 5.91 | 5.85 |
| | දින 182 | - | - | 6.04 | 5.86 | 5.95 | 5.90 |
| | දින 364 | 6.12 | 6.05 | 6.13 | 5.91 | 6.02 | 5.97 |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 6.91 | 6.64 | 6.77 | 6.64 |
| | < වසර 03 | 8.10 | - | 7.93 | 7.68 | 7.81 | 7.73 |
| | < වසර 04 | - | - | 8.62 | 8.33 | 8.48 | 8.35 |
| | < වසර 05 | - | - | 9.06 | 8.75 | 8.90 | 8.69 |
| | < වසර 06 | - | - | 9.24 | 8.87 | 9.05 | 8.91 |
| | < වසර 08 | - | - | 9.44 | 9.08 | 9.26 | 9.18 |
| | < වසර 10 | 10.05 | - | 9.72 | 9.37 | 9.55 | 9.55 |
| | < වසර 15 | - | - | 9.66 | 9.25 | 9.45 | 9.40 |
| | < වසර 20 | - | - | 9.79 | 9.42 | 9.60 | 9.35 |
| | < වසර 30 | - | - | 9.56 | 9.31 | 9.44 | 9.44 |

(අ) 2021 සැප්තැම්බර් 15 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු
(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යන්‍ය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය ඉහළට විතැන් වී ඇති අතර, අවුරුදු <10 සහ අවුරුදු <30 පරිණත කාල සහිත භාණ්ඩාගාර බැඳුම්කර හැර අනෙකුත් භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය පසුගිය සතියට සාපේක්ෂව ඉහළට විතැන් වී ඇත.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය % | ද්විතීයික වෙළඳපොළ % | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2022-ජන-18 | 5.75 | - | 44.54 |
| | 2022-ජූලි-25 | 5.88 | 42.78 | 37.17 |
| | 2023-අප්‍රේ-18 | 5.75 | 33.09 | 29.99 |
| | 2024-මාර්-14 | 6.85 | 26.13 | 24.38 |
| | 2024-ජූනි-28 | 6.35 | 23.57 | 22.06 |
| | 2025-ජූනි-03 | 6.13 | 19.63 | 18.53 |
| | 2025-නොවැ-03 | 6.85 | 19.35 | 18.31 |
| | 2026-ජූලි-18 | 6.83 | 18.17 | 17.31 |
| | 2027-මැයි-11 | 6.20 | 16.34 | 15.55 |
| | 2028-අප්‍රේ-18 | 6.75 | 15.90 | 15.27 |
| | 2029-මාර්-14 | 7.85 | 16.51 | 15.89 |
| | 2030-මාර්-28 | 7.55 | 15.36 | 14.84 |






## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2021 සැප්තැම්බර් 15 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,068,829.21 | 2,074,633.54 |
| භාණ්ඩාගාර බැඳුම්කර (අ) | 6,350,461.55 | 6,294,679.55 |
| **එකතුව** | **8,419,290.76** | **8,369,313.08** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 1,865.81 | 2,087.92 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 461,082.00 | 460,966.73 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය 10.64ක ප්‍රතිශතයකින් අඩු වී ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 39,500.00 | 64,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 52,940.00 | 84,329.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 19,578.00 | 30,784.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 50,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 95,537.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 41,782.00 | - |

**මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 1.3 ගුණයක් වන අතර භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 1.9 ගුණයකි.**

| ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 32,855.99 | 37,264.97 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 171,464.20 | 230,285.28 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 133,504.73 | 67,795.89 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 648,048.55 | 633,996.67 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 1.71ක ප්‍රතිශතයකින් වැඩි වී ඇත.**

අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර රු. මිලියන 56,662.21 ක් ඇතුළත් වේ. එයින් රු. මිලියන 25,216.61 ක් සහ රු. මිලියන 31,445.60 ක් පිළිවෙලින් 2022.01.01 සහ 2032.01.01 දින පරිණත වීමට නියමිතය.

## 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) -2021 සැප්තැම්බර් 17

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.89 | 5.86 | 99.89 | 5.68 | 0.00 |
| මාස 1 | 99.51 | 5.90 | 99.53 | 5.74 | 0.01 |
| මාස 2 | 99.02 | 5.96 | 99.04 | 5.82 | 0.02 |
| මාස 3 | 98.51 | 6.04 | 98.55 | 5.90 | 0.04 |
| මාස 4 | 98.02 | 6.03 | 98.06 | 5.89 | 0.05 |
| මාස 5 | 97.52 | 6.03 | 97.58 | 5.89 | 0.06 |
| මාස 6 | 97.00 | 6.08 | 97.08 | 5.92 | 0.08 |
| මාස 7 | 96.50 | 6.08 | 96.59 | 5.92 | 0.09 |
| මාස 8 | 95.99 | 6.10 | 96.11 | 5.92 | 0.12 |
| මාස 9 | 95.49 | 6.10 | 95.61 | 5.93 | 0.12 |
| මාස 10 | 94.98 | 6.11 | 95.11 | 5.95 | 0.13 |
| මාස 11 | 94.47 | 6.12 | 94.62 | 5.96 | 0.15 |
| මාස 12 | 93.91 | 6.18 | 94.10 | 5.99 | 0.19 |

## 3.6 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2021 සැප්තැම්බර් 17

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 09.45%2021A | 7 | 2021 ඔක්තෝබර් 15 | 28 | 100.27 | 5.63 | 100.29 | 5.39 | 0.02 |
| 11.50%2021A | 5 | 2021 දෙසැම්බර් 15 | 89 | 101.32 | 5.81 | 101.39 | 5.55 | 0.06 |
| 08.00%2022A | 10 | 2022 ජනවාරි 1 | 106 | 100.63 | 5.69 | 100.66 | 5.56 | 0.04 |
| 10.70%2022A | 3 | 2022 මාර්තු 15 | 179 | 102.29 | 5.93 | 102.38 | 5.74 | 0.09 |
| 11.20%2022A | 9 | 2022 ජූලි 1 | 287 | 103.85 | 6.10 | 104.00 | 5.90 | 0.16 |
| 10.00%2022A | 8 | 2022 ඔක්තෝබර් 1 | 379 | 103.55 | 6.41 | 103.83 | 6.13 | 0.29 |
| 05.75%2022A | 3 | 2022 නොවැම්බර් 15 | 424 | 99.27 | 6.41 | 99.53 | 6.17 | 0.27 |
| 07.90%2022A | 3 | 2022 දෙසැම්බර් 15 | 454 | 101.62 | 6.51 | 101.93 | 6.25 | 0.30 |
| 08.65%2023A | 3 | 2023 ජනවාරි 15 | 485 | 102.47 | 6.66 | 102.81 | 6.40 | 0.33 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු 15 | 544 | 104.53 | 6.76 | 104.90 | 6.51 | 0.37 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 605 | 107.10 | 6.89 | 107.49 | 6.65 | 0.39 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 666 | 105.22 | 7.09 | 105.75 | 6.79 | 0.53 |
| 09.00%2023A | 10 | 2023 සැප්තැම්බර් 1 | 714 | 103.28 | 7.17 | 103.86 | 6.85 | 0.58 |
| 11.20%2023A | 9 | 2023 සැප්තැම්බර් 1 | 714 | 107.06 | 7.26 | 107.57 | 6.99 | 0.51 |
| 07.00%2023A | 20 | 2023 ඔක්තෝබර් 1 | 744 | 99.50 | 7.26 | 99.91 | 7.05 | 0.41 |
| 06.30%2023A | 3 | 2023 නොවැම්බර් 15 | 789 | 97.77 | 7.43 | 98.41 | 7.10 | 0.63 |
| 11.60%2023A | 5 | 2023 දෙසැම්බර් 15 | 819 | 108.33 | 7.49 | 109.03 | 7.16 | 0.70 |
| 11.40%2024A | 10 | 2024 ජනවාරි 1 | 836 | 107.69 | 7.66 | 108.11 | 7.46 | 0.43 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු 15 | 910 | 107.02 | 7.75 | 107.46 | 7.56 | 0.44 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 1,002 | 105.71 | 7.88 | 106.29 | 7.65 | 0.58 |
| 11.00%2024A | 8 | 2024 අගෝස්තු 1 | 1,049 | 107.41 | 8.05 | 108.04 | 7.81 | 0.63 |
| 09.85%2024A | 5 | 2024 සැප්තැම්බර් 15 | 1,094 | 104.52 | 8.12 | 105.09 | 7.91 | 0.57 |
| 06.00%2024A | 10 | 2024 දෙසැම්බර් 1 | 1,171 | 94.00 | 8.16 | 94.53 | 7.96 | 0.53 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු 15 | 1,275 | 104.74 | 8.65 | 105.71 | 8.33 | 0.97 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 1,322 | 101.05 | 8.65 | 101.99 | 8.35 | 0.94 |
| 11.00%2025A | 10 | 2025 අගෝස්තු 1 | 1,414 | 107.37 | 8.71 | 108.17 | 8.47 | 0.80 |
| 10.35%2025A | 8 | 2025 ඔක්තෝබර් 15 | 1,489 | 105.15 | 8.81 | 106.26 | 8.50 | 1.11 |
| 06.75%2026A | 5 | 2026 ජනවාරි 15 | 1,581 | 92.43 | 8.89 | 93.12 | 8.69 | 0.69 |
| 09.00%2026A | 13 | 2026 පෙබරවාරි 1 | 1,598 | 100.09 | 8.97 | 100.86 | 8.76 | 0.77 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු 1 | 1,626 | 86.38 | 9.14 | 87.23 | 8.88 | 0.85 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 1,718 | 107.11 | 9.10 | 108.16 | 8.84 | 1.04 |
| 11.50%2026A | 10 | 2026 අගෝස්තු 1 | 1,779 | 108.78 | 9.22 | 109.97 | 8.93 | 1.20 |
| 11.40%2027A | 8 | 2027 ජනවාරි 15 | 1,946 | 108.64 | 9.30 | 110.02 | 8.98 | 1.39 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 2,097 | 110.40 | 9.36 | 111.89 | 9.04 | 1.48 |
| 07.80%2027A | 7 | 2027 අගෝස්තු 15 | 2,158 | 92.83 | 9.41 | 94.56 | 9.00 | 1.73 |
| 10.30%2027A | 8 | 2027 ඔක්තෝබර් 15 | 2,219 | 103.38 | 9.55 | 105.36 | 9.13 | 1.98 |
| 11.25%2027A | 10 | 2027 දෙසැම්බර් 15 | 2,280 | 107.83 | 9.55 | 109.89 | 9.13 | 2.06 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු 15 | 2,371 | 105.34 | 9.63 | 107.24 | 9.24 | 1.90 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 2,418 | 96.58 | 9.71 | 98.03 | 9.40 | 1.45 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 2,479 | 97.00 | 9.61 | 98.69 | 9.26 | 1.69 |
| 11.50%2028A | 13 | 2028 සැප්තැම්බර් 1 | 2,541 | 109.54 | 9.59 | 111.01 | 9.31 | 1.47 |
| 13.00%2029A | 15 | 2029 ජනවාරි 1 | 2,663 | 117.64 | 9.58 | 119.53 | 9.25 | 1.89 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 2,783 | 116.83 | 9.81 | 119.46 | 9.37 | 2.63 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 3,162 | 105.38 | 10.05 | 107.78 | 9.65 | 2.40 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු 15 | 3,466 | 107.66 | 9.98 | 109.91 | 9.63 | 2.26 |
| 08.00%2032A | 20 | 2032 ජනවාරි 1 | 3,758 | 87.69 | 9.93 | 90.16 | 9.52 | 2.47 |
| 09.00%2032A | 20 | 2032 ඔක්තෝබර් 1 | 4,032 | 94.03 | 9.90 | 96.78 | 9.48 | 2.75 |
| 11.20%2033A | 15 | 2033 ජනවාරි 15 | 4,138 | 108.11 | 9.98 | 110.63 | 9.63 | 2.52 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 4,275 | 93.65 | 9.93 | 96.49 | 9.50 | 2.83 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 4,305 | 122.77 | 9.93 | 126.22 | 9.50 | 3.45 |
| 09.00%2033B | 20 | 2033 නොවැම්බර් 1 | 4,428 | 93.54 | 9.93 | 96.43 | 9.50 | 2.89 |
| 13.25%2034A | 20 | 2034 ජනවාරි 1 | 4,489 | 122.46 | 10.03 | 126.39 | 9.55 | 3.93 |
| 10.25%2034A | 15 | 2034 සැප්තැම්බර් 15 | 4,746 | 99.64 | 10.30 | 102.75 | 9.87 | 3.10 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු 15 | 4,927 | 108.14 | 10.37 | 112.17 | 9.85 | 4.04 |
| 10.50%2039A | 20 | 2039 අගෝස්තු 15 | 6,541 | 102.29 | 10.22 | 105.84 | 9.80 | 3.55 |
| 12.00%2041A | 25 | 2041 ජනවාරි 1 | 7,046 | 115.02 | 10.20 | 117.89 | 9.90 | 2.87 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 7,927 | 89.17 | 10.25 | 92.00 | 9.90 | 2.83 |
| 13.50%2044A | 30 | 2044 ජනවාරි 1 | 8,141 | 127.71 | 10.30 | 131.54 | 9.95 | 3.83 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 8,293 | 126.78 | 10.40 | 131.70 | 9.95 | 4.92 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු 1 | 8,566 | 117.31 | 10.50 | 122.45 | 10.00 | 5.15 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික

| අයිතමය | 2021 සැප්තැම්බර් 17 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)(අ) | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 198.50 | 203.00 | 200.75 | 200.75 | 184.92 |
| ස්ටර්ලිං පවුම් | 272.35 | 281.14 | 276.75 | 277.68 | 239.14 |
| ජපන් යෙන් | 1.80 | 1.87 | 1.83 | 1.83 | 1.76 |
| යුරෝ | 232.61 | 241.18 | 236.90 | 238.05 | 217.66 |
| ඉන්දියානු රුපියල් (ආ) | | | 2.72 | 2.72 | 2.51 |
| වි.ගැ.හි. ( 2021 සැප්තැම්බර් 16 දිනට ) | | | 284.62 | 284.92 | 261.28 |
| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් (ඇ) (එ.ජ. ඩොලර් මිලියන ) | | | 2021 අගෝස්තු | මසකට පෙර | වසරකට පෙර |
| මිලදී ගැනීම් | | | 49.38 | 37.65 | 121.00 |
| විකිණීම් | | | 225.50 | - | 28.00 |




| අයිතමය | 2021 සැප්තැම්බර් 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 14.54 | 16.01 | 53.18 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) (ඈ) | | | |
| මාස 1 | 200.78 | 201.06 | 184.66 |
| මාස 3 | - | - | 184.83 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 13.53 | 8.10 | 33.77 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) (2021 සැප්තැම්බර් 16 දිනට) | 792.41 | 843.68 | 1,736.87 |

(අ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව. 9.30 ට පවතින)

(ආ) මහ බැංකුවේ දෛනික විනිමය අනුපාතිකය

(ඇ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(ඈ) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය

## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

| අයිතමය | | 2020 අගෝස්තු | 2021(අ) අගෝස්තු | 2020 ජන.-අගෝ. | 2021 (අ) ජන.-අගෝ. | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | - | 5,040 | 507,311 | 24,377 | (95.2) |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | - | 6.8 (ඇ) | 681.9 (ආ) | 32.8 (ඇ) | (95.2) |
| | (රුපියල් බිලියන) | - | 1.4 (ඇ) | 124.1 (ආ) | 6.5 (ඇ) | (94.8) |

| | | 2020 අගෝස්තු | 2021(අ) අගෝස්තු | 2020 ජන.- අගෝ. | 2021 (අ) ජන.- අගෝ. | % වෙනස |
|---|---|---|---|---|---|---|
| විදේශ සේවා නියුක්තිකයන්ගේ | (එ.ජ. ඩොලර් මිලියන) | 664.5 | 446.6 | 4,346.2 | 4,224.3 | (2.8) |
| ප්‍රේෂණ ලැබීම් | (රුපියල් බිලියන) | 122.9 | 89.5 | 805.5 | 831.7 | 3.3 |

(අ) තාවකාලික

(ආ) 2020 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත .

(ඇ) 2021 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය විය හැකිය .






## 4.3 2021 අගෝස්තු මස අවසානයට නිල සංචිත වත්කම් (අ) (ආ)

| | |
|---|---:|
| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | **3,550.7** |
| (1) විදේශ මුදල් සංචිත | 2,957.9 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 68.2 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 132.9 (ඇ) |
| (4) රත්‍රන් | 390.6 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.1 |

(අ) තාවකාලික
(ආ) චීන මහජන බැංකුව සමඟ අස්සන් කළ චීන රෙන්මින්බි බිලියන 10ක (ආසන්න වශයෙන් එ. ජ. ඩොලර් බිලියන 1.5ක) විදේශ විනිමය හුවමාරු ගිවිසුම මෙහි අන්තර්ගත නොවේ.
(ඇ) 2021 අගෝස්තු 23 වන දින ශ්‍රී ලංකාවට ලැබුණු ජා.මූ. අරමුදලේ වි.ගැ.හි මිලියන 554.8ක වෙන් කිරීමෙන් වැඩි කොටසක් එ.ජ. ඩොලර්වලට පරිවර්තනය කරන ලදී.

## 4.4 2021 ජූලි මස අවසානයට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය (අ) (ආ)

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---:|
| නිල සංචිත වත්කම් | **2,805.9** |
| (1) විදේශ මුදල් සංචිත | 2,334.4 |
| (අ) සුරැකුම්පත් | 376.5 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 1,958.0 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල සමඟ | 615.2 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 1.3 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 1,341.5 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 68.4 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 12.2 |
| (4) රත්‍රන් | 390.8 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 0.1 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් (ඇ) (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | එකතුව | කල්පිරීම | | |
|---|---:|---:|---:|---:|
| | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු | (6,985.0) | (260.6) | (1,447.2) | (5,277.2) |
| ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම | (5,597.7) | (226.8) | (1,116.9) | (4,253.9) |
| පොලිය | (1,387.3) | (33.8) | (330.3) | (1,023.2) |
| ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම | | | | |
| පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | (531.0) | (200.0) | (151.0) | (180.0) |
| (i) හිඟ (–)(ඈ) | (531.0) | (200.0) | (151.0) | (180.0) |
| (ii) අතිරික්ත (+) | | | | |
| 3. අනෙකුත් | (0.1) | (0.1) | | |
| ප්‍රතිවිකිණුම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ගෙවීම් (-) | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | (0.1) | (0.1) | | |

(අ) තාවකාලික
(ආ) චීන මහජන බැංකුව සමඟ අස්සන් කළ චීන රෙන්මින්බි බිලියන 10ක (ආසන්න වශයෙන් එ. ජ. ඩොලර් බිලියන 1.5ක) විදේශ විනිමය හුවමාරු ගිවිසුම මෙහි අන්තර්ගත නොවේ.
(ඇ) මෙහි අන්තර්ගත වන්නේ ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම් පමණි .
(ඈ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .

## 4.5 විදේශීය වෙළඳාම

| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2020 ජන.-ජූලි | 2021 ජන.-ජූලි (අ) | % වෙනස | 2020 ජන.-ජූලි | 2021 ජන.-ජූලි (අ) | % වෙනස |
| **අපනයන** | **5,497.8** | **6,802.6** | **23.7** | **1,015,851.6** | **1,339,969.3** | **31.9** |
| කෘෂිකාර්මික | 1,300.1 | 1,526.0 | 17.4 | 241,115.6 | 300,742.8 | 24.7 |
| කාර්මික | 4,176.5 | 5,236.4 | 25.4 | 770,811.3 | 1,031,311.4 | 33.8 |
| ආහාර, පාන හා දුම්කොළ | 262.2 | 296.5 | 13.1 | 48,562.2 | 58,407.0 | 20.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 2,413.0 | 2,941.5 | 21.9 | 445,059.4 | 579,058.5 | 30.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 246.2 | 248.6 | 1.0 | 45,231.9 | 49,061.7 | 8.5 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 450.4 | 621.0 | 37.9 | 83,278.6 | 122,376.6 | 46.9 |
| වෙනත් | 804.7 | 1,128.7 | 40.3 | 148,679.3 | 222,407.6 | 49.6 |
| ඛනිජ අපනයන | 12.6 | 27.6 | 118.2 | 2,343.4 | 5,433.5 | 131.9 |
| වෙනත් අපනයන | 8.6 | 12.5 | 46.4 | 1,581.3 | 2,481.6 | 56.9 |
| **ආනයන** | **8,968.3** | **11,724.8** | **30.7** | **1,661,617.8** | **2,309,571.9** | **39.0** |
| පාරිභෝගික භාණ්ඩ | 2,071.7 | 2,255.0 | 8.8 | 384,505.5 | 444,050.0 | 15.5 |
| අන්තර් භාණ්ඩ | 4,901.1 | 6,932.4 | 41.4 | 907,410.1 | 1,365,375.3 | 50.5 |
| ආයෝජන භාණ්ඩ | 1,984.3 | 2,530.6 | 27.5 | 367,633.0 | 498,804.3 | 35.7 |
| වෙනත් | 11.2 | 6.8 | (39.4) | 2,069.2 | 1,342.3 | (35.1) |
| **වෙළඳ ශේෂය** | **(3,470.5)** | **(4,922.3)** | **-** | **(645,766.2)** | **(969,602.6)** | **-** |

(අ) තාවකාලික



















## 4.6 වෙළඳ දර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2021 ජූලි (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 153.6 | 140.2 | 151.0 |
| ප්‍රමාණය | 163.1 | 156.7 | 170.2 |
| ඒකක වටිනාකම | 94.2 | 89.5 | 88.7 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 153.0 | 148.5 | 115.8 |
| ප්‍රමාණය | 152.7 | 146.7 | 138.7 |
| ඒකක වටිනාකම | 100.2 | 101.2 | 83.5 |
| වෙළෙඳ මිල අනුපාතය | 93.9 | 88.4 | 106.2 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.7 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2020 ජූලි | 2021 (අ) ජූලි | % වෙනස | 2020 ජූලි | 2021 (අ) ජූලි | % වෙනස |
|---|---|---|---|---|---|---|
| කොළඹ තේ වෙන්දේසිය | කි.ග්‍රෑම් 1 ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1 ක් රුපියල් | | |
| තේ මිල | 3.30 | 2.96 | (10.5) | 613.83 | 591.09 | (3.7) |
| ආනයන (මි.ර.ගැ.) | මෙට්‍රික් ටොන් 1 ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1 ක් රුපියල් | | |
| සහල් | 588.33 | 849.01 | 44.3 | 109,339.56 | 169,782.43 | 55.3 |
| සීනි | 403.24 | 623.64 | 54.7 | 74,941.49 | 124,713.91 | 66.4 |
| තිරිඟු | 260.06 | 294.30 | 13.2 | 48,330.98 | 58,854.26 | 21.8 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් | 46.23 | - | - | 8,592.25 | - | - |

(අ) තාවකාලික